
# ජාතක කතා පොතෙන් මතු කොට දැක්වෙන ආචාර ධර්ම

30 නොවැම්බර්, 2019



**ආචාර්ය දිල්ශාන් මනෝජ් රාජපක්ෂ**

**සීලය, සීලයේ ප්‍රභේද, සීලයේ ආනිසංස පිළිබඳ සෑම ජාතකකතාවක ම අන්තර්ගත වේ. කාඤ්චන-ස්කන්ධ ජාතකයේ දී සීලය චූල සීලය, මජ්ඣිම සීලය සහ මහා සීලය යනුවෙන් ද තවදුරටත් ප්‍රාතිමෝක්ෂ සීලය, ඉන්ද්‍රිය සංවර සීලය, ආජීව පාරිශුද්ධ සීලය, ප්‍රත්‍යසන්නිශ්‍රිත සීලය යනුවෙන් ද සීලයේ ප්‍රභේද රැසක් ඉදිරිපත් වේ.**

කීකරුකම, කළගුණ සැලකීම, වැඩිහිටි උපස්ථානය, සමඟිය, පොරොන්දු ඉටු කිරීම, කල්‍යාණ මිතුරන් ඇසුර, මිත්‍ර ධර්මය සහ ස්වාමි ගෞරවය යනාදි සදාචාරවත් කරුණුවල නරත වීමේ ආනිසංස නිපල්ලත්ථ මිග ජාතකයේ දී ඉදිරිපත් කෙරේ. මීට අමතර ව තිත්තිර ජාතකය, රුක්ඛධම්ම ජාතකය, ගුණ ජාතකය, සවර්ණ කර්කටක ජාතකය ගිජ්ඣ ජාතකය, මාතුපෝසක ජාතකය, ඡන්දකින්නර ජාතකය, චුල්ලහංස ජාතකය, සාම ජාතකය වැනි ජාතකකතාවලින් ප්‍රකට කෙරේ. එසේ ම ගුත්තිල, සේරිවාණිජ වැනි ජාතක-කතා ද අසම්පදාන, චුල්ලපදුම, සන්ධිභේද, එන්දන කතාවලින් දුශ්චරිතවලින් අත්විඳීමට සිදු වන විපත්ති ද කළ නොදත්කම, අසත්පුරුෂ බව, කේලාම් කීම හා කේලාම් ඇසීම, පළිගැනීම, පරිසර විනාශය, සැකය ආදි නුගුණවල ආදීනව ද ප්‍රකට කෙරේ.

වෘත්තීමය වශයෙන් සිය කටයුතු සාරථක කරගැනීමේ දී ගුණධර්ම අනුව කටයුතු කිරීම වැදගත් බව පෙන්වා දෙන ජාතකකතා පොත ව්‍යවහාරික හෙවත් ප්‍රායෝගික හෙවත් වෘත්තීය ආචාරධර්ම පාර්ශ්වය අතින් ද සඳු-පදේශ රැසක් ලබාදෙයි. වෙළඳාමේ දී ආචාර ධර්ම සුරැකීම පිළිබඳත් යහගුණවත් වෙළෙන්දෙකු සතු වන ලක්ෂණත් එමඟින් ඔහු අත්විඳින ආනිසංසත් සහ සදාචාර විරෝධී කූට වෙළෙන්දන්ගේ ස්වභාවයත් එම-ඟින් ඔවුන් අත්විඳින ආදීනවත් පිළිබඳ විවිධ විවරණ අපූරු කතාපුවත් තුළ අන්තර්ගත වන ආකාරය සේරි-වාණිජ, අපණ්ණක, චූලසෙට්ඨි, කූටවාණිජ, කුරග්ග, වණ්ණුපථ, අත්ථස්සද්වාර ආදි ජාතකකතාවලින් ප්‍රකට වේ.

සදාචාර සම්පන්න ගුරු භූමිකාව පිළිබඳ විධුර සහ ගුත්තිල ජාතක ද වෛද්‍ය වෘත්තිය පිළිබඳ තොරතුරු මහා උම්මග්ග ජාතකය ද නිරවද්‍ය ගොවියෙකු වන්නේ කෙසේදැයි මහාකපි ජාතකයේ ද රාජ්‍ය පාලකයෙකු, මැති-ඇමැතිවරයෙකු, රාජ්‍ය සේවකයෙකු, හමුදා සේවකයෙකු, ග්‍රාම නිලධාරීවරයෙකු වන්නේ කෙසේදැයි කුරුධම්ම, තේසකුණ, මහාබෝධි, චූලධර්මපාල, චූලහංස, සත්තිකුම්භ වැනි ජාතකකතාවලින් ආනාවර-ණය කෙරේ. සමස්තයක් ලෙස ඕනෑ ම වෘත්තිකයෙකුට යහපත් වෘත්තියකවේදියෙකු වීමට අවශ්‍ය මඟ, අනුගමනය කළ යුතු ධර්මතා සෑම ජාතකකතාවකින් ම නිරූපණය වන බව පෙනේ.

## බෝසත් චරිතය

සමාජයේ ජීවත් විය යුත්තේ තමා පමණක් නොවේ. සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීමේ අභිප්‍රායෙන් පරාර්ථ චර්යාවේ නිරත වීමට ජාතක පොතේ එන බෝසත් චරිතාපදානය ලබාදෙන ආලෝකය විශිෂ්ට ය. තමා සහ අනෙකා අතර පරතරය මැනවින් තෝරා බේරාගෙන තමාගේ මෙන් ම අන්‍යන්ගේ ද සුබසාධනය සලකා බලා ක්‍රියා කළ යුතු ආකාරය ජාතකපොතේ බෝසත් චරිතය ලබාදෙන ආදර්ශ සමුදාය වෙනත් කිසිදු සාහිත්‍යයකින් දැකගත නොහැකි ය.

ථෙරවාද සාහිත්‍ය තුළ බෝධිසත්ත්ව චරිතයත් බුද්ධ චරිතයත් පරිපූර්ණ ලෙස ගොඩනැන්වී ඇති මූලාශ්‍රය ඉතා අල්ප ය. එයින් ද බෝධිසත්ත්ව චරිතය පරිපූර්ණ ලෙස ගොඩනඟා ඇති වැදගත් ම මූලාශ්‍රය වන්නේ ජාතකපාළිය උදෙසා කර තිබෙන ජාතකට්ඨකථාව යි. ජාතකකට්ඨකථාව පදනම් කරගෙන රචනා වී ඇති පන්සිය පනස් ජාතක පොත් වහන්සේ වනාහි ථෙරවාද බෞද්ධයන්ට බෝසත් චරිතය පරිපූර්ණවත් පැහැ-දිලිවත් රසවත්වත් ඉදිරිපත් කෙරෙන කියවිය හැකිවූත් ප්‍රයෝගිකව ක්‍රියාත්මක කළ හැකි වූත් මඟපෙන්වා

දෙන අත්පොතය. එහි දී වඩාත් වැදගත් වන්නේ බෝසත් චරිතය සමාජ ශෝධනය කේන්ද්‍ර කොටගත් මානවයා ප්‍රමුඛ සමස්ත ජීව-අජීව පරිසරයට ම හිතකාමී පරමාදර්ශී වූ ද උතුම් වූ ද චරිතාපදනායක් ලෙස ඉදිරිපත් වීමය.

බෝසත් චරිතයත් සමාජ ශෝධනයත් ඒකාබද්ධ කොටගත් බෞද්ධ අධ්‍යයනයේ වන සුවිශේෂ විෂය පැතිකඩ වන සමාජ ක්‍රියාන්විත බුදුසමයට (Social Engaged Buddhism) අදාළ න්‍යායාත්මක හා ප්‍රායෝගික නිදසුන් රැසක් මෙහි අන්තර්ගත වන්නේ ආචාරවිද්‍යාත්මක ව ද ඇගයීමට ලක් කළ හැකි අයුරෙනි. පන්සිය පනස් ජාතකකතා පොතේ ඇති කොතෙකුත් නිදර්ශන ඒ සඳහා ගත හැකි අතර කුලාවක ජාතකයෙන් එම නිදර්ශනය ස්ඵුට කළ හැකි වේ. එහි එන මඝ මානවක නම් තරුණයෙකු පළමු ව පෞද්ගලික ව පරිසරය පිරිසුදු කිරීමට ගත් වැයමක් ක්‍රමානුකූල ව එම ක්‍රියාවලට ළැදි පිරිසක් ද සමඟ පුළුල් කොට හුදී ජනයාට පොදුවේ සෙතක් වනු පිණිස මංමාවත්, මඟ දෙපස පැන්තාලි, පොකුණු මෙන් ම පාලම්, ඒ දඬු ද නගරශාලා ද කරවීමෙන් දෙලොවම සාර්ථක කරගත් ආකාරය විවරණය වේ.

## අන්තවාද ප්‍රහාණය

සදාචාරවත් දිවිපෙවතකට යහපත් දැක්මක් ද වැදගත් වේ. අරිඅටැඟි මඟෙහි එන සම්මා දිට්ඨියෙහි කියැවෙන්නේ එම යහපත්, පුළුල් දෘෂටිය වේ. අයහපත්, පටු, වැරදි යන අදහස් දරන දර්ශනය මිථ්‍යා දෘෂ්ටිය වන අතර එයින් ඉවත් නොවුවහොත් එහි ආදීනව මෙලොව-පරලොව යන දෙ අංශයටම හානිදායක වේ. පටු, පාපකාරී, පාපී, නොපුළුල්, නිරර්ථක, අන්තවාද කොතෙක් දුරට ආදීනව උපදවන්නේ ද?, එම අන්තවාද ප්‍රහාණයේ ආනිසංස කවරේ ද?, අන්තවාද ප්‍රහාණය සදාචාර දිවිපැවැත්මකට කොතෙක් දුරට ඉවහල් වන්නේ ද යනාදිය මනාව ප්‍රකට කෙරෙන ජාතකකතා කිහිපයක් දැකිය හැකිය.

තත් කාලීනයන් ආගමික කරුණුවල දී එක්තරා ආකාරයක ලෝකධර්ම ප්‍රචලිතව පැවැති ආකාරය ජාතකකතාවලින් පෙනේ. ඒ අනුව එකල මිනිසුන් පුදපූජා, වන්දනා, දාන, දෙවියන් සරණයෑම සිදු කළ අයුරු ජාතකකතා සඳහන් කරයි. යක්ෂ, වෘක්ෂ, නාග, ගරුඬ හා ගංගාවලට ස්තුති කොට පිහිට පතන ආකාරයක් ඒවායින් පෙනේ.

එකල මිනිසුන්ගේ ලෞකික විශ්වාස ආදිය පිළිබඳ තොරතුරු ද ජාතකකතා අනාවරණය කරයි. දේවධම්ම ජාතකය සහ නලපාන ජාතකය මෙහි දී වැදගත් වේ. සමාජයේ ස්ත්‍රියට තිබූ පහත් තැන කටාහක ජාතකයේ දැක්වේ. සුරාපානය (සුරාපාන ජාතකය), යාගය සහ සත්ත්ව හිංසාව (දුම්මේධ ජාතකය) සොර බිය (බුරප්ප ජාතකය) දුකෙළිය (විධුරපණ්ඩිත ජාතකය), අල්ලස් ගැනීම් (කණවේර ජාතකය) ආදි සදොස් චින්තන හා ක්‍රියා විවේචනාත්මක ව ඉදිරිපත් වේ.

වැරදි අනර්ථකාරී වෘත සමාදන් වීම නරකයෙහි ඉපදීමට හේතු වන ආකාරය ලෝමහංස ජාතකයේ ඉදිරිපත් වේ. නැකැත් තරු බැලීමෙන් පමණක් සියල්ල තීරණය කිරීමට යෑමේ අනර්ථකාරී බව ද මිථ්‍යා දෘෂටි ප්‍රහාණයේ වැදගත්කම ද නක්ඛත්ත ජාතකයේ ඉදිරිපත් වේ. නානා විධ ආගම් සිය පිළිවෙත් පටලවා සිදු කරන ආකාරය පහදන බුදුරදුන් නංගුට්ඨ සහ සන්ථව ජාතකවල දී අනර්ථකාරීව ගිනි දෙවියන් පුදන ආකාරය දක්වා ඇත. කුලභේදය සහ අනර්ථකාරී ලෙස සිය බල පරාක්‍රම විහිදුවමින් දුබල පෙළීම විවේචනය කෙරෙන

අයුරු මාතංග ජාතකයේ දී දැකිය හැකි ය. නිරර්ථක යාගය පිළිබඳ විවරණයක් භූරිදත්ත ජාතකයේ දී ඉදිරිපත් වන අතර සමස්තයක් ලෙස මහාබෝධි ජාතකයේ දී සහ මහා නාරද ජාතකයේ දී මිථ්‍යා දෘෂ්ටීන්ගේ ආදීනව ඉදිරිපත් වේ.

## උභයාර්ථ සාධනය

එක් පසෙකින් බලන විට සූත්‍ර දේශනාවල පැනෙන ආචාර ධර්ම පිළිබඳ න්‍යායන් සක්‍රීය මට්ටමින් ප්‍රායෝගිකකරණය වන්නේ ජාතකකතාවල දී ය. උභයාර්ථසාධනයෙහි ලා ජාතකකතා පොතේ නැමියාව කරුණු සතරක් ඔස්සේ දැක්විය හැකි ය.

1. පදනම සහ අරමුණු, සම්ප්‍රදාය කෙරෙහි දැක්වූ ආකල්පය සහ තෙරුවන් සරණ යෑම
2. චර්යාවේ සුචරිතමය නියමයන් හෙවත් ප්‍රායෝගික අංශය, උභයාර්ථ සංවර්ථනික ආචාර ධර්ම
3. සදාචාර සඵලත්වය: ආචාර ධර්මයේ අනාගරික අංශය පදනම් කොටගත් විරාගී දර්ශනය
4. මානසික අභ්‍යාසය හා ආධ්‍යාත්මික සාක්ෂාත්කරණය: තණ්හා, උපාදානයන් ක්ෂය කිරීම.

බුදුසමයේ ඉදිරිපත් වන සන්තානගත හා සමාජගත උභයාර්ථ සාධනය පිණිස උපයුක්ත වන ධර්ම කරුණු ජාතකකතා රාශියකින් මතු වේ. එසේ ම පුද්ගලයාගේ දියුණුව පිණිස උට්ඨාන වීර්යය, ප්‍රඥාව, සුවච බව, කල්‍යාණමිත්‍රත්වය, අල්පේච්ඡතාව, පතිරූපදේසවාසය, මිතභාණී වීම (මොනෙය්‍යපටිපදා), අකම්පා ගුණය ඉන්ද්‍රීය දමනය, අවිහංසාව, සත්‍ය බව, සංයමය යනාදි ගුණ උපකාරී වන බව ජාතකතා රැසකින් විශද වේ. සමාජ සංවර්ධනය හා සුභසාධනය පිණිස සමඟිය, කළගුණ සැලකීම (කතඤ්ඤුතා), යුතුකම් ඉටු කිරීම, ප්‍රිය වචන කතා කිරීම, සත්‍ය වචනය, මෛත්‍රීය, කරුණාව, දානය, පරාර්ථචර්යාව, ධර්මචර්යාව යනාදි කරුණු මතු කෙරේ.

ඕනෑ ම රටක සමෘද්ධිය, සංවර්ධනය සහ සහජීවනය මෙන් ම ආචාර ධර්මවල පැවැත්මට පාලකයන්ගේ ක්‍රියාකාරකම් ඍජු ව ම බලපායි. රාජ්‍ය පාලනයේ දී රාජ්‍ය සමෘද්ධිය සහ සදාචාර ධර්ම සංවර්ධනයට ද උපදෙස් රැසක් සරභංග, කෙළිසීල, මහාබෝධි, මහාසුපින, මහා උම්මග්ග, බන්ධභාල වැනි ජාතකවල දී අන්තර්ගත වේ. රාජ්‍ය පාලනයේ නිරත රජු තම ප්‍රජාව කෙරෙහි ක්‍රියා කළ යුත්තේ මෛත්‍රී සහගත චින්තනයෙන් වන අතර ඇකයේ හොත් පුතකු තුටු කරන මවක මෙන් සියලු සතුන් සතුටට පත් කරමින් ධාර්මික ව ය. චුල්ලහංස ජාතකයේ එන දසරාජ ධර්ම ද පාලන තන්ත්‍රය සදාචාර සම්පන්න කරගැනීමට ලබා දී ඇති වටිනා ඉගැන්වීමකි. ඒවා නම්,

"දානං සීලං පරිච්චාගං - අජ්ජවං මජ්ජවං තපං
අක්කෝධං අවිහිංසංච - ඛන්තිංච අවිරෝධතා"

| | |
|---|---|
| 1. දානය | 6. තපස |
| 2. සීලය | 7. අක්‍රෝධය |
| 3. පරිත්‍යාගය | 8. අවිහිංසාව |
| 4. ඍජු බව | 9. ඉවසීම |
| 5. මෘදු බව | 10. අවිරෝධය |

යථාර්ථය පසක් කරගැනීම පිණිස පුද්ගලයා කටයුතු කළ යුත්තේ කෙසේ ද? ආධ්‍යාත්මික සංවර්ධනය පිණිස පුද්ගලයා කටයුතු කළ යුත්තේ කෙසේ ද? යන කරුණු පිළිබඳ පුළුල් විග්‍රහයක් ජාතක කතාවලින් පැනේ. එහි දී මානසික සුවය ඇති කරගැනීමේ වැදගත්කම චක්කවාක ජාතකයේ දී පෙන්වා දී ඇත. අනිත්‍ය, දුක්ඛ සහ අනාත්ම යන ත්‍රි ලක්ෂණය අනුව ලෝකය දෙස බැලීම හත්ථිපාල, සෝණ වැනි ජාතකවල දී පෙන්වා දී ඇත.

ඉන්ද්‍රීය දමනය අතිශය වැදගත් බවත් ඉන්ද්‍රීය දමනය නොකර ගතහොත් ප්‍රතිවිපාක රැසකට මුහුණ දෙන්නට වන අයුරුත් විකණ්ණක ජාතකයේ දී පෙන්වා දී ඇත. උපාදානය නොකර සියල්ල අතහැරීම, පංච නීවරණ යටපත් කිරීම විමුක්තිය පිණිස ඉවහල් වන ආකාරය කාන්චනක්ඛන්ධ ජාතකයේ දී පෙන්වා දෙයි. කිසිවක් මට ය, මාගේ ය, මා උදෙසා ය යනුවෙන් නොගෙන කටයුතු කිරීමෙන් විමුක්තිය සාක්ෂාත් කරගත හැකි බව කාමනීත, වළාහස්ස, මච්ඡ, අසංක වැනි ජාතකවල දී පෙන්වා දෙයි. තෘෂ්ණාව මුලිනුපුටා කටයුතු කිරීමේ වැදගත්කම මතරෝදන, කෙසව, සුජාත, මිගපෝතක වැනි ජාතකකතාවල දී පෙන්වා දෙයි. මමත්වය මුලිනුපුටා දමා සියල්ල අත්හැරීමෙන් ආධ්‍යාත්මික ශාන්තිය උදා කරගත හැකි අයුරු සෝණ, මහාජනක, යුද්ධඤ්ජය වැනි ජාතකවල දී මතු වේ. බුද්ධත්වය උදෙසා පූරණය කළ පාරමිතා අතර බෝසතුන්ගේ නෙක්ඛම්ම පාරමිතාව ප්‍රකට කෙරෙන සියලු ම ජාතකකතාවලින් ප්‍රදර්ශනය වන්නේ එම කරුණයි.

## පාරිසරික ආචාර ධර්ම

පරිසර සංරක්ෂණය විෂයෙහි ලා අවධානය යොමු කරමින් කටයුතු කිරීම ධරණීය සජවර්ධනය හෙවත් තිරසාර සංවර්ධනය (Sustainable Development) යි. මතු පරපුරේ අවශ්‍යතා ඉටු කරගත හැකි වන පරිද්දෙන් වත්මන් පරපුරේ අවශ්‍යතා ඉටු කරගැනීම උදෙසා කටයුතු කිරීම සඳහා පරිසර සංරක්ෂණ පිළිවෙත් පිළිබඳ හදාරන නූතන විද්‍යාර්ථීන්ට ජාතක පොතෙන් ඉගෙනගත හැකි ආදර්ශ බොහෝමයකි. පරිසරයට අනුගතව විසීමේ වැදගත්කම චුල්ලනාරද ජාතකයෙන් පෙන්වාදෙයි. අසීමිත වූ ආශාව හමුවේ පරිසර සම්පත් බෙදාගැනීමේ කෝලහාල නොකළ යුතු බව රුක්ඛධම්ම ජාතකයේ දී පෙන්වාදෙයි. එසේ ම පරිසර සංරක්ෂණයෙහි ලා කටයුතු කළ යුතු ආකාරය කුලාවක ජාතකයේ ද පරිසරය පවිත්‍ර ව තබාගත යුතු ආකාරය හා එහි වැදගත්කම සමුද්දවාණිජ ජාතකයේ ද දැක්වේ. අල්පේච්ඡතා පදනමින් ලෝකයේ වසය කිරීම පරිසර සංරක්ෂණයෙහි දී අතිශය සාර්ථක ම ප්‍රවේශය යි. එබැවින් භික්ෂු ජීවිතය සැකසී ඇත්තේ සැදැහැයෙන් ලබන චීවරය වුව විවිධ ප්‍රයෝජන ලබාගත හැකි වන පරිදදෙනි.

## සමාලෝචනය

ජාතකකතා සංග්‍රහය ඉතා පුරාණයේ දී පටන් ම පොදු ජනයාගේ ජීවිතය කෙරෙහි බලපෑමක් ඇති කොට එයින් ඔවුන්ගේ ජීවන දර්ශනය සකස් කළ හැකි ආකාරය සැලකිය යුත්තකි. සද්-ආචාර ධර්ම ඵලදායී බව පෙන්වා දෙන ජාතකකතා තමාගේ යහපත් සිදු කරන ක්‍රියාවල ආනිසංස අත්විඳීමේ ක්‍රමය ලෙස සත්‍ය ක්‍රියා කිරීම ගෙනහැර දක්වා ඇත. මුගපක්ඛ ජාතකයේ දැක්වෙන ආකාරයට කශී රජුගේ මෙහෙසිය සත්‍ය ක්‍රියා බලයෙන් දරුවන් ලබා ඇත. වට්ටක ජාතකයේ දී වටු පැටවුන් සත්‍ය ක්‍රියා බලයෙන් දිවි බේරාගැනීමට

වෘක්ෂයක ඇති වූ ගින්න නිමා දමා ඇත. වැඩිවියට පත් කුමාරිකාවන්ට තමාට ස්වාමියෙකු සොයාගැනීමට සත්‍ය ක්‍රියා කළ බව අම්බ ජාතකයේ සඳහන් වේ.

ජාතකකතා නූතන ගද්‍ය පද්‍ය දෙස් විදෙස් සාහිත්‍ය ආචාර සමාචාර සම්පන්න කරන ගුණාත්මක ආදර්ශ පද්ධතියකි. එමෙන් ම සදාචාර සම්පන්න සමාජ ව්‍යාපාර, සමාජ සුභසාධන ක්‍රියා සිදුකිරීම පිළිබඳ ජාතක-කතා ලබාදෙන උපදෙස් අතිමහත් ය. ස්ථානෝචිත ප්‍රඥාව හෙවත් තැනට උචිත නුවණ යොදාගෙන එළ-ඹෙන්නා වූ බාධක, අභියෝග ජය ගැනීම පිණිස ජාතකකතා පොත ලබාදෙන උපදෙස් රැසකි. සාර්ථක සදා-චාර සම්පන්න දිවිපෙවතක් ගත කිරීමට ප්‍රඥාව මෙහෙය වීමෙන් ලැබෙන ආනිසංස රැසකි.

පන්සිය පනස් ජාතක පොතේ සියලු ම ජාතක ධර්මමය පදනමින් කොටස් අටකට (08) බෙදා දැක්විය හැකි ය.

1. පාරමිතා 2. බණ 3. උපදෙස් 4. ගුණ ධර්ම

5. දුසිරිත් 6. ස්ත්‍රීන් 7. මිථ්‍යා දෘෂ්ටි 8. වෙනත්

ජාතකකතාවල මුල් කතුවරයාට විශේෂ වූ මූඛ්‍ය අරමුණු තුනක් (03) වේ. ඒවා නම්,

1. ජාතකකතා මඟින් පුනර්භවය ඉදිරිපත් කිරීම

2. බුදුන් වහන්සේගේ පාරමිතා පූරණය

3. බෞද්ධයා යහමඟට ගැනීම ආදිය යි.

එමඟින් පෙනෙන්නේ සෑම ජාතකකතාවකින් ම සදාචාර දර්ශනය තේමා කොටගෙන ඇති බව යි. සදාචාර සම්පන්න ජීවිතයක් ගතකිරීම මෙලොව-පරලොව යන දෙලොව ම හේතු වේ. එම සදාචාර විරෝධී ව කට-යුතු කරමින් උභයාර්ථය පිණිස පසුබට වූවාට පසු කලෙක පසුබට වීමට සිදු වේ. එලෙස ජීවිතයේ කිසි ලෙසකින්වත් කිසි කලෙකවත් පසුබට නොවී යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය උපදෙස් ජනසන්ධ ජාත-කයෙන් පැනේ. ඒ අනුව ජාතක කථාගත ආචාර ධර්ම පුද්ගලයාට ද සමාජයට ද එමෙන් ම පාලකයාට ද පාලිතයාට ද එපමණක් නොව මෙලොව වශයෙන් ද පරලොව වශයෙන් ද එමෙන් ම කායික, මානසික හා ආධ්‍යාත්මික සංවර්ධනයට ද මඟ පෙන්වා දෙන බව පෙනේ.